මෙහි තමාට තමා රැවටීම යැයි කියනු ලබනුයේ අන්‍ය ධර්මයක වේශයෙන් අන්‍ය ධර්මයක ආකාරයෙන් සත්ත්ව සන්තානයෙහි පහල වන සිත්වලට රැවටීමය. ස්වීය තත්ත්වය වසා ගෙන අන්‍ය වේශයකින් සිත් පහළවනුයේ නන් වෙස් ගන්නා කෙලෙසුන් හා සම්ප්‍රයෝගයෙනි ආර්ය මාර්ග ඥානය උපදවා එහි බලයෙන් මතු නූපදනා පරිද්දෙන් කෙලෙසුන් නොනැසූ පුද්ගලයා තුළ ඒ කෙලෙසුන් කොතෙක් කල් යටපත් වී තිබුණත් කොතරම් උත්සාහයකින් යට පත් කරන ලදුවත් කෙලෙසුන්ට හිත වූ අරමුණක් මුණ ගැසුණුකල්හි ඒ ක්ලේශයෝ උපදනාහුය. කෙලෙසුන් ගේ හා පව් කම්වල ආදීනවය දැක්වෙන ධර්මයන් ඇසිමෙන් ද කෙලෙසුන් හා පව් පිළිකුල් කරන සත්පුරුෂයන් ඇසුරු කිරීමෙන් ද නුවණ වැඩීමෙන් ද සත්ත්වයන් කෙරෙහි කෙලෙසුන්ට හා පව්කම්වලට බියක් පිළිකුලක් ඇති වේ. එය වනාහි කෙලෙසුන්ටත් පව්කම්වලටත් විරුද්ධ හැගීමකි.

ආරක්‍ෂකයකු ඇත්තා වූ ගෙයකට සොරුන්ට පිවිසීමට අවකාශ මද වන්නාක් මෙන් ක්ලේශයන්ට විරුද්ධ වූ ඒ හැඟීම ඇත්තා වූ තැනැත්තාගේ සන්තානයෙහි ක්ලේශයන් ගේ පහළ වීමටත් පහළ වී ක්‍රියාකාරි වීමටත් අවකාශ මඳ වන්නේය. එකල්හි ක්ලේශයෝ ඒ පුද්ගලයාගේ සන්තානයෙහි පහළ වීමටත් ක්‍රියාකාරි වීමටත් අන් මගක් ගනිති. එනම් යම් කිසි කුශල ධර්මයක වේශය කුශල ධර්මයක ආකාරය ගැනීමය.

ක්ලේශයක් තමාගේ ආකාරය සඟවා යම් කිසි කුශල ධර්මයක වේශයෙන් උපන් කල්හි කෙලෙසුන් පිළිකුල් කරන කෙලෙසුන්ට බිය වන තැනැත්තා රැවටෙන්නේය. හෙතෙම කුශල ධර්මයකැයි සිතා එය පිළිගන්නේය. එයට ස්වසන්තානයෙහි වැඩෙන්නටත් ක්‍රියාකාරි වීමටත් ඉඩ දෙන්නේය. මෙසේ තමන්ගේ නියම ආකාරය සඟවා යම් කිසි කුශල ධර්මයක වේශයෙන් පහළ වන්නා වූ ක්ලේශයෝ වඤ්චක ධර්මය නම් වෙති. තමන්ගේ සන්තානයෙහිම හටගන්නා වූ මේ ක්ලේශයන්ට රැවටීමට ලෝක ව්‍යවහාරය අනුව කියන කල්හි තමාට තමා රැවටීම යයි කියනු ලැබේ.

කෙලෙසුන් කෙරෙන් දුරු ව පාපයෙන් වෙන්ව ශුද්ධ ජීවිතයක් ගත කරනු කැමැත්ත ඇති ගිහි පැවිදි බොහෝ සත්පුරුෂයෝ වඤ්චක ධර්ම නම් වූ කුශල වේශයෙන් පැමිණෙන මේ ක්ලේශයන්ට රැවටී ශුද්ධව විසීමේ අපේක්‍ෂාව තිබිය දී ම ඒ ක්ලේශයන්ට ඉඩ දීම වශයෙන් සමහර විට කෙලෙස් වඩති.

කෙලෙස් සහිත සිතිවිලි සිතති. ඒ ක්ලේශයන්ට වසඟ වීමෙන් පින් කරමි යන අදහසින් පව් කරති. ආත්මශුද්ධිය අපේක්‍ෂා කරන පින්වතුන්ට කෙලෙසුන්ගේ නන් වෙසින් පැමිණීම මහත් බාධාවකි. ක්ලේශ වඤ්චක ස්වභාවය ගැන නොදත් පුද්ගලයෝ මේ ක්ලේශ වඤ්චනයට වඩාත් හසුවෙති. ආත්ම ශුද්ධි අපේක්‍ෂා කරන පෘතග්ජනයන්හට ඒ ශුද්ධිය මැනවින් රැකගැනීමට ඇත්තා වූ උපාය නම් ක්ලේශයන්ගේ වඤ්චක ස්වභාවය ගැනත් ඒ ඒ ක්ලේශයන් ගන්නා වේශයනුත් මැනවින් දැන ගැනීමය.

ලෝභය ද්වේශය ඊර්ෂ්‍යාව මාත්සය්‍ර්‍ය මානය ථීන මිද්ධය කුක්කුච්චය අහරිකානෝත්තප්පය දෘෂ්ටි මෝහ විචිකිත්සාව යන වඤ්චක ධර්මයන්ගෙන් බේරීමට ආත්ම විශුද්ධිය අපේක්‍ෂාකරන පිංවතා දැනගත යුතුය. ඉහත වඤ්චක ධර්මයන්ගෙන් දෙකක් වන ලෝභය ගැන ස්වල්ප වශයෙන් ද රාගය ගැන දීර්ඝ වශයෙන්ද පහත විස්තර කර ඇත.

## ලෝභය



නො ලැබූ සැප සම්පත් ලැබිමේ ලෝභය ලැබූ සම්පත් පවත්වා ගැනීමේ ලෝභය සැප විඳීමේ ලෝභය යැයි ලෝභය තෙ වැදෑරුම් වේ. එයින් නොලැබූ සැප සම්පත් ලැබිමේ ලෝභය පරාර්ථකාමතා දාතුකාමතාදී වෙස් ගෙන වඤ්චා කරන්නේය.

## පරාර්ථකාමතා වේශයෙන් වඤ්චක ලෝභය

''පරාර්ථකාමතා'' යනු කුශලච්ඡන්දයකි. අනුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන පරාර්ථකාමී සත් පුරුෂයන් ඒ නිසා කීර්ති ප්‍රශංසා ගරු බුහුමන් ලාබ සත්කාර තනතුරු ලබනු දක්නා තැනැත්තා කෙරෙහි තමාටත් ඒවා ලැබීමේ ආශාව ඇති වේ. කිර්ති ප්‍රශංසාදීය ලබනු පිණිස අනුන්ට වැඩ කිරීම වනාහි අනුන්ට යහපත කිරීමේ ආකාරයෙන් මේ ආත්මාර්ථය ම සිදු කර ගැනීමකි. එසේ කිරීම ලෝකයා රැවටීමකි. එය ගුණවතුන් විසින් නැණවතුන් විසින් පිළිකුල් කරන දෙයකි. ඒ බව තේරුම් ගත් තැනැත්තා කෙරෙහි කීර්ති ප්‍රශංසාදිය ලබනු සඳහා පරාර්ථය පිණිස ක්‍රියා කිරීම ලාමකය. නොමනා දෙයක යන අදහස ඇති වේ.

මේ අදහස ලොවට වැඩ කොට ලබන කීර්ති ප්‍රශංසාදිය පිළිබඳ ආශාව ඔහුගේ සිත් හි ඇති වීමටත් ඇති වූවත් ක්‍රියා කාරිත්වයට පැමිණිමටත් බාධකයක් වෙයි. ඔහු ඒ ආශාව සිත් හි හටගත් සෑම අවස්ථාවක දීම එයට වැඩෙන්නටත් ක්‍රියාකාරි වීමක් ඉඩ නොදී සිතින් බැහැර කරයි. නැවත නැවත එසේ බැහැර කරන කල්හි කීර්ති ප්‍රශංසාදිය පිළිබඳ වූ ඒ ලෝභය ඔහුගේ  අදහසට අනුකූල වන ලෙසට අන් වෙසක් ගනි. කල්යෑමෙන් ඔහුගේ සිත් හි පෙර නො පැවති පරාර්ථකාමතාවක් ඇති වේ. එය පෙර කී ලෝභය පරාර්ථකාමතා වේශයෙන් ඔහුගේ සන්තානයෙහි පහළ විමය.

මෙසේ පරාර්ථකාමතා වේශයෙන් ඒ ලෝභය එළඹ සිටි කල් හී පෙර එය පිළිකුල් කොට බැහැර කරමින් සිටි තැනැත්තා රැවටී එය පිළිගනී. එයට ක්‍රියාකාරී වීමට හේ ඉඩ දෙයි. පරාර්ථකාමතා ප්‍රතිරූපක ඒ ලෝභයට අනුකූල වී හේ ඉන්පසු පරාර්ථය පිණිස ක්‍රියා කරන්නට බස්නේය.

සමරහර විට මෙබඳු අවස්ථාවල දී ප්‍රතිරූපක පරාර්ථකාමතාව නොව නියම පරාර්ථකාමතාව වූ කුශලච්ඡන්දයමත් ඇති වේ. කුශල ප්‍රතිරූපක පරාර්ථකාමතාවේ හා කුශල පරාර්ථකාමතාවේ වෙනස තේරුම් ගැනීම නම් අතිශයින් දුෂ්කරය. ඒ දෙකෙහි වෙනස සාමාන්‍යයෙන් මෙසේ සැලකිය යුතු ප්‍රතිරූපක පරාර්ථකාමතාවෙන් ක්‍රියා කරන තැනැත්තා තමාට වාසියක් නො පෙනෙන තැන දී එය ගැන වැඩි සැලකිල්ලක් නො දක්වයි. කිරීමෙන් ප්‍රසිද්ධියට පැමිණෙන පරාර්ථ සාධක කටයුතු සොය සොයා කරයි. අමාරුවෙන් වුව ද කරයි. තමාගේ ක්‍රියාව ප්‍රසිද්ධ නොවන තැන දි උපකාරයක් ඉල්ලා එන තැනැත්තාට වුව ද සැලකිල්ලක් නොකරයි. ප්‍රසිද්ධ වන තැන දී අනුන්ගෙන් උපකාරයක් නො වුව මනා අයට ද උපකාර කරන්නට තැත් කරයි. කුශල පරාර්ථකාමය ඇති තැනැත්තා ප්‍රසිද්ධ වන නොවන දෙතැන දීම වෙනසක් නැතිව ක්‍රියා කරයි.

## දතු කාමතා වේශයෙන් වඤ්චක ලෝභය

''දතු කාමතා'' යනු දෙනු කැමැත්තය. එය කුශලච්ඡන්දයකි. ලෝභයට විරුද්ධ ස්වභාවයකි. එහෙත් ස්වල්පයක් දීමෙන් අනුන් සතුටු කරවීමෙන් ඔවුන්ගෙන් බොහෝ දේ ලැබිය හැකි බව හා බොහෝ වැඩ කරවා ගත හැකි බව තමාට අනුන් අනුකූල කරවාගත හැකි බව ද දක්නා වූ තැනැත්තා කෙරෙහි සමහර විට ලෝභය දතු කාමතා සංඛ්‍යාත කුශලච්ඡන්දයාගේ වේශයෙන් පහළ වේ. දීම කුශලයක් වුව ද අනුන්ගෙන් ගැනීම පිණිස දෙන දිමනාව කුශල පක්‍ෂයට නොවැටේ. ගැනීමට කරන උපක්‍රමයක් වූ ඒ දීම නියම දීමක් නොව ගැනීමේ ම කොටසකි. ලෝභ සහගත ක්‍රියාවක් බැවින් අකුශල පක්‍ෂයට වැටෙන්නකි. දතු කාමතා සංඛ්‍යාත කුශලච්ඡන්දයාගේ වේශයෙන් හටගත් ලෝභය ඇති තැනැත්තා කුශලධ්‍යාශයකැ යි ඒ ලෝභයට රැවටී දීම යහපත් වැඩක්ය කුසලය-ක් ය කියා අනුන්ගෙන් ගනු රිසියෙන් ලෝභ සහගත වූ අකුශල් දිමනාව කරන්නට බස්නේය. දිම කුශලයක් වනුයේ ද අලෝභය, මෛත්‍රිය, ප්‍රඥාව යන ධර්මයන්ගෙන් යුක්ත වූ සිතින් කරන කල්හිය. ලෝභය ද්වේෂය මෝහය යන මේවායින් යුක්ත වූ සිතින් කරන දිම් සියල්ලම අකුශල වන්නේය.

## පුණ්‍යකාමතා වේශයෙන් වඤ්චක ලෝභය

නුදුටු ප්‍රදේශ දැකීම පිළිබඳ වූ ද නුදුටු වස්තූන් දැකීම පිළිබඳ වූ ද උත්සව දැකීම පිළිබඳ වූ ද බොහෝ ස්ත්‍රී පුරුෂයන් දැකීම පිළිබඳ වූ ද අලංකාර සැරසිලි දැකීම පිළිබඳ වූ ද ආශාව පුණ්‍යකාමතා වේශය ගන්නේය. එයට රැවටුණ තැනැත්තේ සමීප විහාරයට ගමේ විහාරයට අවුරුදු ගණනකට වරක් වත් වන්දනාවට නො යතත් දුර පලාත්වල දුර රටවල විහාර වන්දනාවට බොහෝ වියදම් දරා ගෙන යන්නේය. එයින් වනුයේ ඔහුගේ දර්ශන ලෝභය නිවී යැමය. දර්ශන පිපාසාව සන්සිඳීම ය. ඒ සන්සිඳිම් ගැන හේ මහා පිනක් කර ගතිම් යි ප්‍රීති වෙයි.

තව ද, ඒ පුණ්‍ය කාමතා වේශයෙන් පැමිණෙන සැප විඳීමේ ලෝභයට රැවටුණ තැනැත්තේ ''පින්කම් යනු'' යි පිරිත් කියවීමේ උත්සව බණ කියවීමේ උත්සව දක්නට ද යන්නේය. සමහර විට බණ කියවීමේ පිරිත් කියවීමේ උත්සව ද කරවයි. මෙකල වන්දනාවේ යන බොහෝ දෙනෙකුගේ ම පුණ්‍යකාමතාව කුශලච්ඡන්දය නොව ලෝභය ම බව කිය යුතුය. බණ පින්කම් පිරිත් පින්කම්වලට යන බොහෝ ස්ත්‍රී පුරුෂයන්ගේ පුණ්‍යකාමතාවත් දර්ශන ලෝභයමය.

## සංවිභාගශීලතා වේශයෙන්

තමා ලත් දෙය තමා ම භුක්ති නොවි ද අන්‍යයන් හා බෙදා වළඳන ස්වභාවය සංවිභාග ශිලතාව යි. එය උතුම් ගුණයකි. සමහරුන් කෙරෙහි පිරිස් ගෙන කා බී ප්‍රීති විමේ ආශාව සංවිභාග ශිලතා වේශයෙන් පහළ වේ. එයින් වඤ්චිත තැනැත්තේ එසේ නො කරන අන්‍යයන්ට මසුරෝ යැ යි නින්දා කරමින් යහළුවන් පිරිවරා ගෙන කාබී ඇවිද සෙල්ලම් කොට ධනය නැති කර ගෙන අන්තිමේ දී කිසි පිහිටක් නැති යහළුවන් නැති දිළින්දෙක් වන්නේය.

## ලෝභය දුරු කිරීමේ දුෂ්කර බව<br>භාර්යාව කෙරෙහි ඇලුම් කළ පුරුෂයාගේ කථාව

පෙර එක් පුරුෂයෙක් සහෝදරයාගේ භාර්යාව හා මිථ්‍යාචාර යෙහි යෙදෙන්නට පටන් ගත්තේය. ඇයට සැමියාට වඩා හෙතෙමේම අතිශයින් ප්‍රීති විය. එක් දවසක් ස්ත්‍රිය සොර සැමියාට කියන්නී මේ කාරණය එළි වුවහොත් මහා නින්දාවක් වන්නේය. මෙය ප්‍රකට නොවනු පිණිස නුඹේ සහෝදරයා මරන්න යයි කිවාය. ඒ පුරුෂයා ''මතු මෙබන්දක් නොකියව'' යි තර්ජනය කොට එය ප්‍රතික්‍ෂේප කෙළේය. කීප දවසකින් පසු නැවතත් ස්ත්‍රිය එසේම කීවාය. එදා ඒ පුරුෂයා මධ්‍යස්ථ විය. ස්ත්‍රිය නැවත දිනයකත් එසේම කීවාය. එදා ඒ පුරුෂයා ස්ත්‍රියගේ කීම පිළිගෙන ''මිනී මැරීම නම් බරපතල දෙයකි. එයට අවකාශයක් කෙසේ ලබන්නෙම්ද'' යැයි කීවේය. එකල්හි ස්ත්‍රිය කියන්නී ''අසවල් තැන කුඹුක් ගස සමීපයේ නාන තොටක් ඇත්තේය. ඔබ ගොස් තියුණු කෙටේරියක් ගෙන ඒ ගස සමීපයේ සැඟ වී සිට මා විසින් එතනට පුරුෂයා එවූ කල්හි මරණු මැනව'' යි කීවා ය. සොර සැමියා එහි සැඟවී සිටියේය. ඒ ස්ත්‍රියගේ ස්වාමියා සවස වැඩ කොට ගෙට ආ කල්හි ආදරයෙන් මෙන් හිස බලන්නට ඔහුට කථා කොට මඳක් හිස බලා ''හිස බොහෝ අපවිත්‍රය සෝදාගෙන එවයි'' කියා හිස සෝදන කල්කයෙන් පිඩක් ද දී කුඹුක් ගස ළඟ තොටුපළට පුරුෂයා පිටත් කළාය. ඔහු දියට බැස නැමී හිස සෝදන කල් හි සැඟ වී හුන් පුරුෂයා ගොස් කෙටේරියෙන් ගසා මැරුවේය. ඒ පුරුෂයා මැරී භාර්යාව කෙරෙහි පැවති ආසාව නිසා ඒ ගෙයිම ගැරඬියෙක්ව උපන්නේය.

ඌ නිතර නිතර ඒ ස්ත්‍රියගේ ඇඟ පිට වැටෙන්නේය. එයින් ඒ ස්ත්‍රිය වූත් අනිකකු නොව ඒ පුරුෂයා ම විය යුතු යයි යලි ගැරඬියා ද මැරවීය. භාර්යාව ගැන පැවති ලෝභය එපමණකින් ද පහ නොවූ බැවින් ගැරඬියා ඒ ගෙයිම බලුව උපන්නේය. බල්ලා ද ඒ ස්ත්‍රිය යන යන තැනට එන්නට පුරුදු විය. එයින් කෝපයට පත් ස්ත්‍රිය බල්ලා ද මැරවිය. එයින් ද ස්ත්‍රිය කෙරෙහි පැවති ලෝභය නො සිඳුන බැවින් ඌ මැරී ඒ ගෙයිම ගොන් වස්සෙක් වූයේය. ගොන් වස්සා ද ස්ත්‍රිය පසු පස්සේ ම එන්නට පුරුදු විය. එයින් කෝපයට පත් ස්ත්‍රිය ගොන් වස්සා ද මැරවීය. එයින් ද ඒ ස්ත්‍රිය කෙරෙහි තිබූ ඇල්ම නො සිඳුනෙන් ඌ ඒ ස්ත්‍රියගේ කුසයෙහි ඇයටම දරුව උපන්නේය. ඔහුට ජාතිස්මරණ ඥානය පහළ වී සතර වාරයකදී ම

තමාගේ ශරීරය ස්පර්ශ කරන්නට ද ඉඩ නුදුන්නේය. මව ස්පර්ශ කළ හොත් ඒ ළමයා මහ හඬින් හඬන්නට වන්නේය. එබැවින් මුත්තණුවන් විසින් ම ඒ ළමයා පෝෂ්‍ය කරන ලද්දේය. ළමයා වැඩුණු කල්හි මුත්තණුවන් විසින් මවට ළංවන්නට වත් නොදෙන කාරණය විචාරණ ලදුව සියලු ප්‍රවෘත්තිය ළමයා මුත්තාට කීය. එකල්හි මුත්තා සංවේගයට පැමිණ ළමයා වැළඳ හඬා ''මෙබඳු අසත්පුරුෂයන් හා වාසයෙන් අපට කිම් ද'' යි ළමයා ද ගෙන එක්තරා විහාරයකට ගොස් දෙදෙනාම පැවිදි ව මහණදම් පුරා රහත් වූවෝය. මේ පුරුෂයාට තමා ඇලුම් කරන කාන්තාව විසින් නැවත නැවත මරනු ලබද් දී ද ඇය කෙරෙහි ආලය දුරු කරන්නට නො හැකි වූයේ ලෝභය දුරු කිරීමට අතිශයින් දුෂ්කර වූ ක්ලේශ ධර්මයක් වන බැවිනි. රහත් වීමට තරම් පින් ඇතිව සිටත් ඔහුට සතර වාරයක් ම පිළිවෙළින් තිරිසන් අපායෙහි උපදින්නට වූයේ ද මේ ලෝභය නිසාය.

## රාගය



ස්ත්‍රීන් දැකීමය ඔවුන්ගේ ක්‍රියා දැකීමය. ඔවුන්ගේ හඬ ඇසීමය, ඔවුන්ගේ ගන්ධය ආඝ්‍රාණය කිරීමය, ඔවුන්ගෙන් ලැබෙන රසය වැළඳීමය, ඔවුන්ගේ ශරීර ස්පර්ශය ලැබීමය, ඔවුන් හා සම්භාෂණයෙහි යෙදීමය, තවත් ක්‍රමවලින් ඔවුන් ඇසුරු කිරීමය යන මේවා පිළිබඳ ව පුරුෂ චිත්තයෙහි හටගන්නා වූ සප්‍රීතික ලෝභය ද පුරුෂ දර්ශනාදිය සම්බන්ධයෙන් ස්ත්‍රී චිත්තයෙහි හටගන්නා වූ සප්‍රීතික ලෝභය ද රාග නම් වේ. මෙය සමහරවිට නිෂ්ප්‍රීතික ද වන්නේය. සමහරවිට තවත් පුරුෂයකු සම්බන්ධයෙන් පුරුෂයකුට ද ස්ත්‍රියක සම්බන්ධයෙන් ස්ත්‍රියකට ද රාගය ඇති වේ. මෙය මෛත්‍රී කරුණා ශ්‍රද්ධාදි අනේක වේශයන් ගෙන පහළ වී වඤ්චා කරන ධර්මයකි.

## මෛත්‍රී රූපයෙන් වඤ්චක රාගය

තමා විසින් රාග වශයෙන් ඇලුම් කිරීම නුසුදුසු කෙනෙකු යන හැඟීම ඇති කෙනෙකු සම්බන්ධයෙන් යම් කිසිවකුට රාගය ඇති වුවහොත් ඒ තැනැත්තා ඒ රාගය දුරු කිරීමට උත්සාහ කරයි. දුරු නොවේ නම් වැඩෙනු නො දෙන්නට උත්සාහ කරයි. වැඩුණේ වී නම් ක්‍රියාකාරී වීමට නොදෙන්නට උත්සාහ කරයි. තමා හට නුසුදුසු පරිදි ඇති වූ ඒ රාගයට බියෙන් එය දුරු කර ගැනීමට උත්සාහ කරන්නා වූ තැනැත්තා කෙරෙහි වැඩෙන්නටත් ක්‍රියාකාරීත්වයට පැමිණෙන්නටත් ඉඩ නො ලබන්නා වූ ඒ රාගය පසුව ඒ තැනැත්තාගේ අදහසට සුදුසු වන සැටියට පුද්ගල තත්වයට සුදුසු වන සැටියට මෛත්‍රී වේශය ගන්නේය. මෛත්‍රී වේශයෙන් හෙවත් මිත්‍රත්වයේ ආකාරයෙන් ඒ තැනැත්තා කෙරෙහි ඒ රාගය පහල වන්නේය. එසේ පහළ වූ කල් හි ඔහුට එය රාගයම බව නො දැනෙන්නේය. එයට රැවටුණා වූ හෙතෙමේ මෛත්‍රීය හෙවත් මිත්‍රත්වය සැම දෙනා සමඟම පැවැත්වීමට සුදුසු දෙයකැයි මෛත්‍රී වේශයෙන් පැමිණි රාගය පිළිගන්නේය. එයට වැඩෙන්නට අවකාශ දෙන්නේය. එසේ අවකාශ ලැබූ රාගය මෛත්‍රී වේශයෙන් ක්‍රමයෙන් වැඩී පසුව රාගයේ සැටියට ම සිට ක්‍රියාකාරිත්වයට ද පැමිණෙන්නේය. මෙබඳු කරුණු වලින් පරෙස්සම් වීම ඉතා දුෂ්කරය නුවණැතියෝ ද මේවාට මුළා වී අන්තයේ දී වරදට පැමිණෙති. මෛත්‍රී රූපය ගන්නා රාගය බොහෝ සෙයින් පැවිද්දන් කෙරෙහි ඇති වේ. එයට වසඟ වි අන්තිමේ දී ඔවුහු ශ්‍රමණ ධර්මයෙන් ද පිරිහෙති.

## කරුණා වේශයෙන් වඤ්චක රාගය

පෝහොසතුන්ට දුප්පත් ස්ත්‍රීන් පිළිබඳව ඇති වන රාගය සමහරවිට කරුණා රූපයෙන් පහළ වේ. එයට රැවටුන තැනැත්තේ අනුන්ගේ අමාරුවට පිහිට වීමේ ආකාරයෙන් ඒ ස්ත්‍රීන්ට සංග්‍රහ කරන්නේය. ඔවුන් හා ආශ්‍රයට ද යන්නේය. දුම්රිය බස්රිය ආදියේ ගමන් කරන අවස්ථාවල දී බොහෝ පුරුෂයන්ට කරුණා රූපයෙන් රාගය ඇති වේ. දුබල රෝගියකු මහල්ලකු මැහැල්ලක පැමිණ කල් හි ඔවුන්ට විශේෂයෙන් කරුණා කළ යුතු වුව ද එබදු අවස්ථාවල දී ඒ පැත්තවත් නොබලන සමහරු හොඳින් හැඳ පැළඳ ගත් තරුණ කාන්තාවක පැමිණෙනු දුටහොත් වහා නැගිට ඇයට තමාගේ අසුන දෙති අසුන් දීමට එකවර දෙතුන් දෙනා නැගිටිනු සමහර විට දක්නා ලැබේ ඔවුන් මෙසේ කරනුයේ ඔවුන් තුළ කරුණා රූපයෙන් පහළ වු රාගයෙනි. රෝගාතුර වූ ස්ත්‍රීන් දක්නා කල්හි ද සමහරුන්ට කරුණා රූපයෙන් රාගය ඇති වේ. එයට රැවටුණාහු තමන් මේ කරනුයේ කුමක් ද කියා නො දැනම කරුණා කිරීමේ ආකාරයෙන් ඒ ස්ත්‍රීන්ට උපකාර කරන්නාහුය.

## ශ්‍රද්ධා වේශයෙන් වඤ්චක රාගය

ශෝභන රූපය හා මිහිරි කට හඬ ද තරුණ බව ද ඇත්තා වූ භික්ෂූන් දක්නා ඇතැම් කාන්තාවන් කෙරෙහි ශ්‍රද්ධා වේශයෙන් (පැහැදීමේ ආකාරයේ) රාගය පහළ වේ. භික්ෂුව සම්බන්ධයෙන් තමන්ගේ සිත් හි පහළ වී තිබෙන දෙය ශ්‍රද්ධාව නොව අනෙකක් බව ඒ කාන්තාවෝ නොදනිති. එයින් මෙහෙයන ලද ඔවුහු ඉන් පෙර භික්ෂුවකට කිසි සැලකිල්ලක් නො කළාහු ද බොහොම හොඳ හාමුදුරුවෝ යැයි. පසසමින් ඒ භික්ෂුව කරා නිතර එළඹෙති සැලකිලි ද කරති. සමහර විට ඒ භික්ෂුව පසසමින් අන්‍ය භික්ෂූන්ට නින්දා කරන්නට ද බසිති. ඔවුන් ගේ මේ ශ්‍රද්ධාව කුමක් ද යන බව ඔවුන් තබා ඔවුන්ගේ හිමියෝ ද නෑයෝද නොදනිති. කාරණය තේරුම් ගැනීමට තරම් නුවණැතියකු මෙය දැන ගෙන කිව හොත් ඔවුහු ඒ තැනැත්තාට ද විරුද්ධ වන්නාහ. ඊර්ෂ්‍යා කාරයෙකැයි දෝෂාරෝපණය කරන්නාහ. ක්ලේශ වඤ්චනයට මනුෂ්‍යයෝ කොතරම් තදින් හසු වෙද්ද යන බව මෙබඳු කරුණු වලින් තේරුම් ගත හැකිය.

## පුණ්‍යකාමතා වේශයෙන් වඤ්චක රාගය

පුණ්‍යකාමතා යනු පින් කරනු කැමති බවය. ශ්‍රද්ධා රූපයෙන් උපන් රාගයම පසුව පුණ්‍යකාමතා රූපය ගන්නේය. එයින් මෙහෙයනු ලැබූ ස්ත්‍රීහු ''පින් කරමි'' යි තමන් ඇලුම් කරන භික්ෂුව නිසා භික්ෂූන්ට දන් දෙති. භික්ෂූන් වෙසෙන විහාරයන්ට ගොස් පින්කම් කරති. මේවා පින් වේ ද නොවේ ද යන බව නිශ්චය කිරීම ඉතා දුෂ්කරය. දර්ශන රාගය ද පුණ්‍යකාමතා වේශය ගන්නේය. ඇතැම් තරුණ තරුණියන් පින් කිරීමට යයි. පිරිත් පින්කම් බණ පින්කම් යන්නේත් වන්දා ගමන් යන්නේත් පුණ්‍ය කාමතා වේශයෙන් පැමිණි රාගයාගේ මෙහෙයීමෙනි.

## කෘතඥතා වේශයෙන් වඤ්චක රාගය

කෘතඥතා යනු කෙළෙහි ගුණ සැලකීමය. ස්ත්‍රියක අතින් උපකාරයක් ලැබූ පුරුෂයා කෙරෙහි ද පුරුෂයකුගෙන් උපකාරයක් ලත් ස්ත්‍රිය කෙරෙහි ද සමහර විට කෘතඥතා වේශයෙන් රාගය පහළ වේ. කෘතඥතා ප්‍රතිරූපක රාගයට රැවටුණ පුරුෂ තෙමේ තේ කෝප්පයකින් මුත් තමාට සංග්‍රහ කළ ස්ත්‍රියගේ බොහෝ ගුණ දකී. ''ගුණ අමතක කිරීම නො වටනේය'' යි ඇය ගැන සැලකිලි කරන්නට වෙයි. ස්ත්‍රීහු ද එසේමය. සමහරවිට තමන්ට උපකාර කරන කාන්තාවන් සම්බන්ධයෙන් ඇතැම් භික්‍ෂූන්ට ද කෘතඥතා ප්‍රතිරූපය ඇතිවේ.

## සමානාත්මතා වේශයෙන් වඤ්චක රාගය

අන්‍යයන් ද තමා හා සම තත්ත්වයෙහි තබා සිතන ස්වභාවය සාමානාත්මතා නම්. එය උතුම් ගුණයකි. බොහෝ සෙයින් පොහොසතුන් දුප්පතුන් ඇසුරු කිරීම තමාට නුසුදුසු දෙයකැයි සලකති. එහෙත් දුප්පත් කාන්තාවන් කෙරෙහි රාග වශයෙන් ඇල්ම පොහොසතුන්ට ද ඇති නො වන්නක් නොවේ. පොහොසත් තරුණයකුට දුප්පත් පවුලක තරුණියක ගැන ඇල්ම ඇති වූ කල් හි ඔහු තුළ පවත්නා වූ දුප්පතුන් ඇසුරු කිරීම තමාට නුසුදුසුය යන හැඟීම ඇය හා සම්බන්ධකම් පැවැත්වීමට බාධාවක් වෙයි. එකල් හි ඒ රාගය සමානාත්මතා වේශය ගන්නේය. එයට රැවටුණු තැනැත්තේ සමානාත්මතා නමැති ගුණය ඉදිරිපත් කර ගෙන රාගයෙන් දුප්පතුන් ඇසුරු කරන්නට පටන් ගනී.

## ප්‍රතිසංස්කාරකාමතා වේශයෙන් වඤ්චක රාගය

තමා කරා පැමිණෙන්නවුන්ට ප්‍රිය වචනයෙන් කථා කොට අවස්ථාවට සුදුසු හැටියට සංග්‍රහ කරන ස්වභාවය ප්‍රතිසංස්කාරකාමතා නම්. මෛථුනාධ්‍යාශමය රාගය යැයි ඇතැමෙක් වරදවා සිතති. දැකීම ප්‍රිය සම්භෂණය ආදිය පිළිබඳ වූ ආශාවත් රාගයමය. දර්ශනයෙන් හා කථා කිරීමෙන් ද ආස්වාදය අතිවන කෙනකු තමන් වෙත පැමිණි කල්හි ඒ ආස්වාදය විඳිනු කැමැති බව රාගය පටිසන්ථාර කාමතා වේශයෙන් පහළ වේ. එයින් වඤ්චිත වූ තැනැත්තේ තමා වෙත පැමිණි තමාගේ මන පිනවන ආගන්තුකයා සමීපයට කැඳවා ඔහු හා ප්‍රිය සම්භාෂණයෙහි යෙදෙන්නේය. ආදරයෙන් ඔහුට සංග්‍රහ කරන්නේය. ඔහු තමා කෙරෙන් ඉවත්ව යන්නට උත්සාහ කළත් ඉක්මනින් එය සිදු කර ගන්නට ඉඩ නොදෙන්නේය. හැකිතාක් කාලයක් ආගන්තුකයා නවත්වා ගන්නට උත්සාහ කරන්නේය. ඔහු ආගන්තුකයාගේ පැමිණි කාරණය ද ඉතා ඕනෑ කමින් ඉටුකර දෙන්නේ ය.

## පරාබිවෘද්ධිකාමතා වේශයෙන් වඤ්චක රාගය

අනුන්ගේ දියුණුවට කැමති බව පරාබිවෘද්ධිකාමතා නම් සමහර විට රාගය පරාභිවෘද්ධිකාමතා වේශය ගන්නේය. එයින් වඤ්චිත වූ තැනැත්තේ ස්ත්‍රීන්හට ඉගෙනීමට උපකාර කිරීම, රක්‍ෂාවල් සොයා දීම යන ආදිය අනුන් දියුණු කිරීමේ කැමැත්තෙන් කරන දෙයක් සැටියට කරන්නේය. ස්ත්‍රීන්ට පමණක් නොව සමහර ළමයින්ට ද පරාභිවෘද්ධිකාමතා ප්‍රතිරූපක රාගයෙන් සංග්‍රහ කරති. රාගය බොහෝ වෙස් ගන්නා ධර්මයකි. ප්‍රිය වාදිතා ධර්ම දේශනා කාමතා, ධර්ම ශ්‍රවණ කාමතා, දතු කාමතා, පරීක්‍ෂණතාදී රාගය ගන්නා වූ තවත් බොහෝ වේශයෝ ඇත්තාහ.

රේරුකානේ චන්දවිමල නාහිමිපාණන්ගේ ලිපියක් ඇසුරින්,
මහාචාර්ය චන්දන ජයරත්න විසින් සකසන ලද ලිපියකි.

**''අ ක්‍රොධයමාරොග්‍ය ජිතෙන්ද්‍රියත්වං**

**දයා ක්‍ෂමා සර්ව ජන ප්‍රියත්වං**

**නිර්ලෝභි දාතා භය ශෝක මුක්තිර්**

**ඥාණ ප්‍රභෙදා දශලක්‍ෂණානි ''**



''ක්‍රෝධ නැති බව ද, නිරෝගි බවද, දිනන ලද ඉඳුරන් ඇති බව ද, දයාවන්ත බව ද ඉවසීම ද, සියල්ලන්ට ප්‍රිය බවද, ලෝභ නැති බව ද, ත්‍යාගවන්ත බව ද, භය නැති බව ද, ශෝක නැති බව ද, යන මේ දසය ඥාණවන්තයාගේ ප්‍රභේද ලක්‍ෂණයි.''

**(ප්‍රත්‍ය ශතකය)**

තුති කුසුම්

# බුදුපිළිම කමිටුවේ පුණ්‍යානුමෝදනය

- මෙත්සවිය බුදු පිළිම කමිටුවේ 2012 ජනවාරි 01 දා සිට 2014 අගෝස්තු 31 දා දක්වා ගිණුම්වල අභ්‍යන්තර විගණනය සිදු කර දෙමින්, මෙම අටමහ කුසල කර්මයට සිය දැනුම සහ කුසලතාවය තුලින් අනුපමේය දායකත්වයක් ලබා දුන් කඩුවෙල කහවිට ආරච්චි සහ සමාගමේ හිමිකරු, වරලත් ගණකාධිකාරී කේ. ඒ. ඩී. පද්මසේන මහතාට, මෙත්සවිය ගරු සභාපති මහාචාර්ය චන්ද්‍රා ජයරත්න මහතා ඇතුළු බුදු පිළිම ක්‍රියාකාරී කමිටුව මෙසේ පුණ්‍යානුමෝදනා කර සිටී.
- මහියංගණයේ පැවති දෙවන අදියරේ සමාරම්භක උත්සවය කිසිදු මුල්‍ය ප්‍රතිලාභයකින් තොරව මාධ්‍ය ආවරණය ලබාදුන්, ප්‍රචාරණය කල ලංකාදීප මාධ්‍යවේදී විශ්ව ගැමුණු ප්‍රියංකර මහතා සහ ඒ මහතා සම්බන්ධ කර දුන්, එම උත්සවය ජාතික රූපවාහිනී , සිරස, සියත රූපවාහිනී නාලිකාවන්හි පුවත් විකාශයන්හි ප්‍රචාරය කරදුන් 29 වන කණ්ඩායමේ පරාක්‍රම පෙරේරා මහතා.
- බුදු පිළිම කමිටුවේ සියලු කාර්යන්හිදී සිය ධනය සහ ශ්‍රමය කැප කරමින් ඒ සඳහා විවිධ පරිත්‍යාගයන් නිරන්තරයෙන් සිදු කරනු ලබන හෙරන් ඉන්දික මහතාට සහ බි.ඩබ්. චමින්ද මහතා.
- කමිටු සාමාජිකයන්ට ටී ෂර්ට් සකස් කර දීමේ කර්තව්‍යයේ දී සිය ධනය සහ සම්පත් කැප කරමින් දායකත්වය දරනු ලැබූ බුදු පිළිම ක්‍රියාකාරී කමිටුවේ නිහාල් පුංචිහේවා මහතාට, බි. ඩබ්. චමින්ද මහතාට සහ 30 වන කණ්ඩායමේ දර්ශන ගලප්පත්ති මහතා.
- රත්නපුරයේ දානපතීන් ගෙන් ආධාර රැස්කර දීමට වෙහෙස වී උපකාර කල රොෂාන් බොතේජු මහතා.
- සැදැහැවතුන්ගෙන් එකතුවූ ආධාර පිලිබඳ විස්තර වෙබ්අඩවියේ පලකල චින්තක බණ්ඩාර මහතා.
- චවුචර පොත් නොමිලයේ මුද්‍රණය කර පරිත්‍යාග කල M. K. ප්‍රියන්ත මහතා.
- ප්‍රධාන භාවනා ශාලාව සඳහා වායු සමීකරණ යන්ත්‍ර දෙකක්, ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමාගේ අනුග්‍රහය යටතේ ලබාදුන්, එතුමාගේ සම්බන්ධීකරණ ලේකම් සහ බුදු පිළිම ක්‍රියාකාරී කමිටුවේ ලේකම් කිංස්ලි පෙරේරා මහතාට, වායු සමීකරණ යන්ත්‍ර සඳහා මුදල් ආධාර කිරීමෙන් දායක වූ මෙත්සවිය සාමාජිකයන්,

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| හර්ෂ ජයවීර සහ ක්‍රිෂාන්ති ප්‍රියදර්ශනී | 29-4429 | රු. 20,000.00 | | රෝහිණි විදානගමගේ | 27-4178 | රු. 1,000.00 |
| මහේෂිකා දේවසුරේන්ද්‍ර | 28-4252 | රු. 5,000.00 | | විපුලි දර්ශිකා | 28-4381 | රු. 1,000.00 |
| P. P. පෙරේරා | 27-4108 | රු. 5,000.00 | | මෙනුකා ලියනගේ | 29-4416 | රු. 1,000.00 |
| D. P. I. කන්දගේ මහතා | | | | නිලනි චමෝදරී සිල්වා | 29-4473 | රු. 1,000.00 |
| ඇතුළු පවුලේ සාමාජිකයන් | 25-3924 | රු. 2,500.00 | | ලතා අබේකෝන් | 29-4411 | රු. 1,000.00 |
| I. W. M. G. වනිගසූරිය | 29-4453 | රු. 2,000.00 | | N. නයනා සිරිවර්ධන | 25-3890 | රු. 1,000.00 |

- ප්‍රධාන භාවනා ශාලාව සඳහා තවත් එක් වායු සමීකරණ යන්ත්‍රයක් ලබාදුන් චමින්ද ඉන්දික, රුක්මල් සිරිවර්ධන, මිරීලා උදයංගනී පවුලේ සැමට සහ මාලනී සේනානායක, සම්පත් හා සඳුන් යන හිතවතුන්ට.
- වායු සමීකරණ යන්ත්‍ර සවිකිරීමට තාක්ෂණික සහය ලබාදුන් ජයලංකා කහවවිතාන 27-4180 සහ නිශා රණසිංහ 28-4246
- කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තුවෙන් තොරව තම දහසකුත් වැඩ කටයුතු තිබියදී තම කාලය, ශ්‍රමය, පෞද්ගලික ධනය කැපකරමින් මෙම මහා කර්තව්‍යය සාර්ථක කරගැනීම සඳහා අපට සහය දක්වන බුදු පිළිම ක්‍රියාකාරී කමිටු සාමාජිකයන් ඇතුළු මෙත්සවිය සාමාජිකයින්ට.
- මහාචාර්ය චන්ද්‍රා ජයරත්න මහතා සහ බුදු පිළිම ක්‍රියාකාරී කමිටුවේ සභාපති පී. පී. පෙරේරා මහතා ඇතුළු බුදු පිළිම ක්‍රියාකාරී කමිටුවේ සියලූම සාමාජිකයන්ට ස්තුතිපූර්වකව මෙසේ පුණ්‍යානුමෝදනා කර සිටිමු.

## 2015 මාර්තු 1 වන දින බොරැල්ල වයි. එම්. බී. ඒ. ශාලාවේ පැවැත් වූ සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වීම පිළිබඳ වැඩමුළුව සඳහා සහභාගී වූ 400 ක් පමණ වන සිසුන් පිරිස සඳහා ආධාර කළ පින්වතුන්...

තේ පැන් සංග්‍රහය සඳහා : ධර්මසිරි ජයසිංහ මහතා / චම්පිකා සිරිබද්ධන මහත්මිය / දර්ශණ රවීන්ද්‍ර ගලප්පත්ති මයා / වික්‍රම ගුණදාස මහතා / නිහාල් පුංචිහේවා මහතා.

අධ්‍යාපන වැඩමුළුවට අවශ්‍ය පොත් මුද්‍රණය කිරීම සඳහා : ජී. ජී. තිලකසිරි මහතා / කුමාර එදිරිසිංහ මහතා / ශ්‍යාමා සමරධීර මෙනවිය / දිනකර මුද්‍රණාලයේ අධිපති එම්. කේ. ප්‍රියන්ත මහතා.

අධ්‍යාපන වැඩමුළුව සඳහා පෑන් ලබාදීම : වෛද්‍ය රුක්ෂාණා ද සිල්වා මිය / ඩී. රාමසිංහ මිය / කල්‍යාණි / ප්‍රසාද් අබේසිංහ මයා / ටී. ජී. එන්. ශාන්ත මයා / සුරංග කුමාර / තනූජ් රත්නායක මයා.

තේ පැන් සංග්‍රහය සංවිධානය කළ ශ්‍යාමා පෙත්තාවඩු මහත්මිය ප්‍රමුඛ කාන්තා කමිටුවට විශේෂ ස්තුතිය.

අධ්‍යාපන වැඩමුළුව සාර්ථක කරගැනීමට උදව් කළ විධායක කමිටුවට, බුදු පිළිම කමිටුවට සහ තරුණ කමිටුවටත්, නන් අයුරින් උදව් උපකාර කළ සැමටත් ස්තුතියි.

## තවත් වසර 2500 කට ආසන්න කාලයේදී සිදුවන ගෞතම බුද්ධ ශාසනයේ අවසානය හා



# ධාතු පරිනිර්වාණය

## මෙසේ සිදුවන වගයි...

ක්ලේශ පරිනිර්වාණය ස්කන්ධ පරිනිර්වාණය ධාතු පරිනිර්වාණයයි බුදුන්ගේ පරිනිර්වාණයෝ තුන් දෙනෙක් වන්නාහ. එයින් කලේශ පරිනිර්වාණය බුද්ධගයා බෝධි මංඩලයේහි දී සකල ක්ලේශයන් නසා බුදු වූ වේලේහිම විය. ස්කන්ධ පරිනිර්වාණය කුසිනාරාවේ යමක සල්ගස් දෙකක් අතර විය. ධාතු පරිනිර්වාණය ප්‍රතිවේද ප්‍රතිපත්ති පයර්‍යාප්ති යන ත්‍රිවිධ ශාසනයේ අතුරුදන් විමෙන්ම වෙයි. එය බුද්ධගයා බෝධි මංඩලයේ දී ම සිදුවන්නේයැයි දත යුතුය.

බුදුන්ගේ සුවාසූ දහසක් ධර්ම ස්කන්ධයන් අග පටන් මුල දක්වා ක්‍රම ක්‍රමයෙන් පිරිහී හැම දෙනාම අන්තර්දාන වූ කල්හි බුදුන්ගේ ත්‍රිවිධ වූ ශාසනයම අන්තර්ධාන වුවා නම් වෙයි. ශාසනයේ අවසාන භික්ෂුව වූ කාසාව කන්ඨකයාද තමාගේ ගෙලෙහි හා අත බැඳි නූල් ද කඩා දමන්නේය. මෙසේ සද්ධර්ම ශාසනය අන්තර්ධාන වන කල්හි එකල රජකල රජ දරුවෝ බුදුන්ගේ පුවත් කටින් කට අසා ඒ බුදුන්ගේ දහම් පද කවුරු හෝ දන්නේ දැයි විචාරා දන්නා කෙනෙක් නොදුක මඟුල් ඇතු සරසා ඇතු පිට සන රන් දහසින් බැඳි පියළි තබවා (සන රන් කාසි පොට්ටනිය ගනීවායි කියන්නාහ. එකල අමාත්‍යයෝ මෙසේ තුන් වාරයක්ම ඒ ඒ දිශාවන්හි ඇවිද ගාථාවක් දන්නවුන් නොදුක නැවත රජු කරා පැමිණ ලෝකය ධර්මයෙන් හිස් වී ඇති බව ද කියා ඒ රන් පියලි සියල්ලක්ම නැවත භාණ්ඩාගාරයටම යැව්වාහුය. එකල බුදුන්ගේ ත්‍රිපිටක ධර්මය පිරිහුනා වෙයි.

එකල ධාතු පරිනිර්වාණය ද වෙයි. හේ කෙසේ ද යත් වෙසඟ මැදි පොහෝ ලද වෛශාඛ යෝගය යෙදුණු දවස් මේ ශ්‍රී ලංකා ද්වීපයෙහි මහියංගණ, දීඝනක, කැළණි, තිස්ස මහ වෙහෙර, ගිරිගඬු, මැඩිලිගිරි, දඹුලු, මහසෙන්ගමු, මිහින්තලා, දෙනානක, භගිරිනක, කුඹුරුප් ආදි වූ සුවහස් ගණන් මහ සෑ ගර්භවල පිහිටි නොයෙක් ධාතුන් වහන්සේ ඒ ක්‍ෂණයෙහිම ඒ ඒ දාගැබ් ගර්භය අතහැර ආකාශයට පැන නැගී ගමන් ගත් තරු පෙළක් සේ අනුරාධපුර නුවර ස්වර්ණමාලි මහ සෑ ගර්භයෙහි දුටු ගැමුණු රජ්ජුරුවන් කැර වූ අසුරියත් මහා ධාතු ගර්භයෙහි මැද පිහිටියා වූ කෙළක් අගනා රිදී යහනෙහි වැඩ හිදිනා කුරුණි දහයක් ධාතුන් වහන්සේ හා එක් තැනට පැමිණෙන සේක.

එදා ධාතු නිධානයේ දී ස්වර්ණමාලි සෑ ගර්භය තුල දැල් වූ සිංහ තෙල් පහන් නො නිවී තිබී ඒ දවස් ඒ පහන් ද නිවී යයි. ඒ වේලෙහි සියලු ලක්දිව සියලු ධාතුන් වහන්සේ ඒ ඒ තැනින් අහස් කුසට පැන නැගී ස්වර්ණමාලි සෑරදුන් කොත මුදුනේ නිර්මිත බුදුරුවක් මැවී දෙව් බඹුන් සහිත මිනිසුන්ට පෙනි පෙනි පූජෝපහාර ලබා ෂඩ් වර්ණ බුද්ධ රශ්මිමාලා විහිදුවමින් යමා මහා පෙළහර පා දින තුනක් ධර්මය දේශනා කොට එක නූලක ඇවුණා වූ ලූ මුතු ඇට පෙළක් සේ ඔවුනොවුන් පසු පස්සෙහි නික්ම නාගදීප දිවයින ඒ දවස් දෙමයිල් නා රජුන්ගෙන් පිළිගෙන අප බුදුන් වැඩ හිඳ බණ දෙසූ නාගදිප චෛත්‍යයේ නිදන්කොට ඇති මැණික් පුටුව මතුයෙහි රැස් වන සේක. එයින් නොයෙක් කෙළ ගණන් දිව්‍ය නාග රාජයන්ගෙන් පූජා ලබා ඒ මැණික් පුටුව හා සමඟ ආකාශයට පැන නැගී ගොස් බෝ මැඩ අප බුදුන් මර සෙන් බිඳ වූ දඹදිව බුද්ධගයා අපරාජිත භූමියට බස්නා සේක.

ඒ කෙණෙහි දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝක, නාග ලෝකා දී ඒ ඒ තැන්හි පිහිටි ධාතුන් වහන්සේ ද ඉතිරි වූ ඒ ඒ දිවයින්වල පිහිටි ධාතුන් වහන්සේ ද, දඹදිව දස ථූපා දී ඒ ඒ රාජධානිවල පිහිටි ධාතුන් වහන්සේ ද, ඒ ඒ තැනින් පැන නැගී පියුම් විලක් කරා දිවයන රාජ හංස සමූහයක් සේ බුදුන්ගේ අවසන් දර්ශන නැමැති මේඝ කාලයෙහි අහසට පැන නැගී දිවන කොකුන් සමූහයක් සේ ආකාශයෙන් වැඩ බෝ මැඩ දී එම ධාතුන් වහනසේ හා එක් වන සේක. එකල බුදු වූ දවසේ සේම පොළොව පළා ගෙන රියන් දහසතරක් වූ වජ්‍රාසනයෙක් පැන නැගි ඒ ධාතු පිළිගන්නි.

ඒ වේලෙහි ඒ සියලු ධාතුන් වහන්සේම ජීවමාන වූ බුදුන් ගේ රූපය මවා ළලාට ධාතුන් වහන්සේ ළලාටයෙහි ම පිහිටන සේක. ඒ මතුයෙහි ඌර්ණ රෝම ධාතුන් වහන්සේ පිහිටන සේක. අකුයෙහි අකු ධාතුන් වහන්සේ පිහිටන සේක. සතර දළඳා වහන්සේ සතර දන්ත ස්ථානයෙහිම පිහිටන සේක. ග්‍රීවා ධාතුන් වහන්සේ ඒ සේම ග්‍රීවයෙහිම පිහිටන සේක. දෙකෙළ පනස් ලක්‍ෂයක් පමණ කේශ ධාතුන් වහන්සේ ඒ ඒ ස්ථානයේ නොවරදවාම පිහිටන සේක. නවානූ දහසක් ලෝම ධාතුන් වහන්සේ ද ඒ ඒ ලෝම කූප නොවරදවාම පිහිටන සේක. ඉතිරි වූ තුන් තරමෙහි විසිරුණා වූ බුදුන්ගේ සොළොස් නැළියක් පමණ ධාතුන් වහන්සේ ද තමන් තමන් වහන්සේ පිහිටියා වු ස්ථානයෙහි පිහිටා නිර්මිත බුදුරුවක් මැවෙන්නාහ.

ඉක්බිත්තෙන් දෙ තිස් මහා පුරුෂ ලක්‍ෂණ හා අසූ අනුව්‍යඤ්ජන ලක්‍ෂණ හා පෙරසේම බුදුරුව තුල නිර්මාණය වෙයි. ඒ කල බුදු වූ දවස් සේම සියො ලඟින් සවනක් රැස්හැර සියලු ලෝක ධාතු ඒකාලෝක කරන සේක. ඒ වේලෙහි දස දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයෝ බුදු රැස් දුක ''අද අප බුදුන්ගේ ධාතු පරිනිර්වාණයේ පානා පෙළහර බලම්හ'' යි නොයෙක් පූජා භාණ්ඩ ගෙන අවුදින් බෝ මැඩ සිසාරා තුන් ලොව පුරා සිට ගන්නාහුය.

ඒ වේලෙහි ධාතු බුදුහු ආකාශයට පැන නැගී ගණ්ඩම්බ නම් වෘක්‍ෂ මූලයෙහි දී පෑ යමක ප්‍රාතිහාර්යය සේම මහ පෙළහර දක්වා, නැවත ආකාශයෙන් බැස බෝ මැඩ වජ්‍රාසනයේ නැගි වැඩ හිදිනා සේක. ඒ වේලෙහි ඒ නිර්මිත බුදුරුවෙන් ගිනිකඳක් පැන නැගී බෝ මැඩ පටන් බ්‍රහ්ම ලෝකයට ඇවිළ සිට ගෙන ධාතු ආදාහනය වන්ට පටන් ගනි. ඒ වේලෙහි දස දහසක් සක්වලින් රැස් වූ දෙවියෝ ''අප බුදුරදුන්ගේ මේ අවසන් දර්ශනයයි, අද තුන් වනු වූ ධාතු පරිනිර්වාණය ය. බුදු කෙනෙකුන් නමක් කප් අසංඛෙය්‍යකිනුත් ඇසිය නොහැක්ක, දක්ක නො හැක්ක, එසේ වූ බුදුහු අද අතුරුදන් වෙති. අහෝ දුකකි අහෝ දුකකි ලෝකය හිස් විය හිස් විය කියා අහස් කුස් පුරා සිටි දෙවියෝ මිහි මඩලෙ හි කඳුළු ධාරා නමැති මහ වැසි වස්සති. ඒ කල අබ ඇටයක් තරම්වත් ධාතුවක් නොතිබී සෑම ධාතුම ආදාහනය වූ කල්හි ගිනි කඳ තෙමේම අන්තර්ධාන වෙයි. ඒ කෙණෙහි ඒ ඒ තන්හි පිහිටියා වු දිව්‍ය නිර්මිතාදි ප්‍රතිමා ද ගල් රූප දැව රූප ලෝහ රූප රිදි රූප ස්වර්ණ රූපාදි සියලු බුද්ධ ප්‍රතිමා ද අන්තර්ධාන වෙයි. සමන්ත කූඨ පර්වතය මුදුනේ සුනාපරන්තයේ (දැනට සව්දි අරාබියේ) මක්කම නම් මකුලව විහාරයේ ද දඹදිව නර්මදා නදි තීරයේ ද සච්ච බද්ධ පර්වතයේද තැබුවා වූ බුදු සිරිපතුල් සටහන් මැකී යන්නාහ. ඒ කල දස දහසක් සක්වල ආකාශයෙහි සහපිරිවරින් සිටියා වූ එක් ලක්‍ෂ පනස් දහසක මහා බ්‍රහ්ම රාජයෝ අනූ දහසක් කාමවචර දිව්‍ය රාජයෝ හා බෝධි මණ්ඩලයට බැස තමන් තමන්ගේ භෝග සම්පත් මහත් වු දිව්‍ය පූජා කරන්නාහු පරිනිර්වාණ පූජාව සේම අප්‍රමාණ වූ පූජා පැවැත් වූවාහුය.

මෙසේ මාගේ බුදුහු තමන් වහන්සේගේ ධතු පරිනිර්වාණ දිනයෙහි පවා මේ සා මහත් වු දිව්‍ය පූජාවන් ලබන හෙයිනුත් ඒසේ වූ පූජා විඳිමට සුදුසු හෙයිනුත්, අර්හත් නම් වන සේක. ඒ ශාන්තිනායක වූ තථාගත බුදුරජාණන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.

පාතේගම ඥානාරාම හිමිගේ ලිපියක් ඇසුරිනි.

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

# ශිෂ්‍යත්ව අයදුම් පත්‍රය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: කඃ 071 401 4467, 011 250 5088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපැල : office@methsaviya.org

01. සිසුවාගේ සම්පූර්ණ නම :..........................................................................

..........................................................................

ශිෂ්‍යයාගේ උඩුකය පිංතූරය

02. පදිංචි ලිපිනය :..........................................................................

:..........................................................................

03. උපන් දිනය :..................................................

04. පාසල් යන්නේ නම්, ඉගෙන ගන්නා පාසල :..........................................

..................................................ශ්‍රේණිය..................

05. මවගේ නම :.................................................. දු:කඃ අංකය :..................

ජීවත්ව සිටී ද :...( ඔව් / නැත )........ ඇයගේ රැකියාව :..................

රැකියාව කරනා ස්ථානයේ ලිපිනය :..................................................

06. පියාගේ නම :.................................................. දු:කඃ අංකය :..................

ජීවත්ව සිටී ද :...( ඔව් / නැත )........ ඇයගේ රැකියාව :..................

රැකියාව කරනා ස්ථානයේ ලිපිනය :..................................................

07. පවුලේ මාසික ආදායම රුපියල් ..................................................

08. ඔබ විසින් වෙනත් ශිෂ්‍යත්ව/ ශිෂ්‍යාධාර ලබා ගන්නේ නම් හා / හෝ අතීතයේ ලබා ගත්තේ නම් ඒ පිළිබඳ විස්තර

:..........................................................................

:..........................................................................

09. සම්පත් බැංකුවේ ගිණුම් අංකය සහ ශාඛාව :

| ගිණුම් හිමියාගේ නම | ගිණුම් අංකය | ශාඛාව |
|---|---|---|
| | | |
| | | |

(ගිණුම් හිමියාගේ බැංකු පොතේ මුල් පිටුවේ ඡායා පියපතක් අමුණා එවන්න) **වෙනත් බැංකු සඳහා කාර්යයාලයෙන් විමසන්න.**

**මා විසින් ප්‍රකාශ කළ ඉහත සඳහන් සියලු තොරතුරු මා දන්නා පමණින් සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි.**

අත්සන :..................................

**(සැලකිය යුතුයි - මෙහි ඇති සියලුම කරුණු සම්පූර්ණයෙන්ම පුරවා එවිය යුතුය. නැතහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)**

ඊළඟ පිටුව →

## විහාරස්ථානාධිපති ස්වාමීන් වහන්සේගේ නිර්දේශය

.......................................................................................................................

විහාරස්ථානයේ ඉහත සඳහන් ශිෂ්‍යයා / ශිෂ්‍යාව අප පන්සලට අයත් සීමාව තුළ ජීවත් වන බවත් / ඉරුදින දහම් පාසලේ ශිෂ්‍යාවක / ශිෂ්‍යයෙකු වන බව / නොවන බවත් හා ශිෂත්වයක් සඳහා සුදුසු බවත් දන්වමි.

විහාරාධිපති නිල මුද්‍රාව :........................................ දිනය :........................................

## විදුහල්පතිතුමා / විදුහල්පතිතුමියගේ නිර්දේශය

.......................................................................................................................

විද්‍යාලයේ ඉහත නම සඳහන් ශිෂ්‍යයා / ශිෂ්‍යාව අපගේ පාසලේ ........................ වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර සපයා ඇති තොරතුරු සත්‍ය බව ද දන්වමි. මා දන්නා පමණින් ඇයට / ඔහුට වෙනත් ආධාර මුදලක් නොලැබෙන බවත් ප්‍රකාශ කරමි. ඇය/ ඔහු ශිෂ්‍යත්වයක් සඳහා සුදුසු යැයි නිර්දේශ කරමි.

විදුහල්පති නිල මුද්‍රාව :........................................ පන්ති භාර ගුරුතුමිය :........................................

## තොරතුරු සත්‍ය බවට මෙත් සවිය සාමාජිකයකු විසින් නිවසට ගොස් පරීක්ෂා කර බලා කරනු බලන නිර්දේශය

මෙත් සවිය සාමාජික අංකය ........................ නම ........................................
වන මා ඉහත සඳහන් දරුවාගේ තොරතුරු සත්‍ය වන බව හා ශිෂ්‍යත්වයක් ලබා දීම සුදුසු / නුසුදුසු යයි නිර්දේශ කරමි.

අත්සන :........................................ දිනය :........................................

## මෙත් සවිය කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ශිෂ්‍යත්වය ප්‍රදානය කරන්නා ........................................ මයා / මිය.

දු. ක :........................................ හඳුන්වා දුන් අංකය :........................................

ශිෂ්‍යත්වය ආරම්භ වන දිනය :........................................ අවසාන වන දිනය :........................................

මාසිකව ප්‍රදානය කිරීමට නිර්දේශිත මුදල රු. :........................................ කි.

පරිපාලන නිලධාරී :........................................

**මෙත් සවිය අසරණ සරණ කමිටු සභාපතිගේ/ මෙත් සවිය ලේකම්ගේ අනුමැතිය - අනුමත කරමි / නොකරමි**

**තනතුර :........................................**


**මෙත් සවිය නිර්මාතෘ හා සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ අනුමැතිය - අනුමත කරමි / නොකරමි**

**සභාපති - මහාචාර්ය චන්දන ජයරත්න මහතා :........................................**

# මෙත් සවිය අසරණ සරණ ශිෂ්‍යත්ව ලාභීන්

| ශිෂ්‍යත්ව ලාභියාගේ නම | පාසල | ශිෂ්‍යත්ව ප්‍රධානියාගේ නම | |
|---|---|---|---|
| පූජ්‍ය දෙමටවැවේ සුසීම හිමි - කහටගස්දිගිලිය. | අනු/ශ්‍රී සදානන්ද මූලික පිරිවෙන, අනුරාධපුරය. | එච්.එම්. චින්තක යුරාජ් බංඩාර මහතා. | රු. 1,000/- |
| පූජ්‍ය ඉහලහල්මිල්ලෑවේ ඥානරතන හිමි - කහටගස්දිගිලිය. | ශ්‍රී භාරතී විද්‍යායතනය, පේරාදෙණිය | මංජුල පත්මකුමාර මහතා. | රු. 1,000/- |
| පූජ්‍ය කොහොඹගස්කඩ නාලක හිමි - - කහටගස්දිගිලිය. | අ/ශ්‍රී විද්‍යාධාර මහා පිරිවෙන, අනුරාධපුරය. | චමින්ද වෙදගේ මහතා. | රු. 1,000/- |
| පූජ්‍ය අම්බලන්ගොඩ සිරි රතන හිමි - කහටගස්දිගිලිය. | සිරි සුමංගල ධර්මායතන පිරිවෙන, අනුරාධපුරය. | මිතිලා උදයංගනී මහත්මිය. | රු. 1,000/- |
| පූජ්‍ය වත්තේවැවේ සුභූති හිමි - දාච්චහල්මිල්ල වැව. | අනු/ශ්‍රී සදානන්ද මූලික පිරිවෙන, අනුරාධපුරය. | ශානිකා සමරවික්‍රම මහත්මිය. | රු. 1,000/- |
| දිනිති මහේෂිකා - දෙකටන | ඉන්දොලමුල්ල කනිෂ්ඨ විද්‍යාලය, දොම්පේ. | සමන්තා නිලංගනී මහත්මිය. (අනුත්තරා ජයවීර) | රු. 1,000/- |
| කේ. එම්. නිරෝෂනී ප්‍රීතිකා දමයන්ති - බිබිල. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. | එච්.පී.කේ. එදිරිසිංහ මහතා . | රු. 1,000/- |
| ඒ. අවිශ්ක ප්‍රසාද් ජයසුන්දර - මොනරාගල. | මො/මහනාම මධ්‍ය මහා විද්‍යාලය. මොනරාගල. | බුද්ධික ජයවීර මහතා සහ බිනරි ගමගේ මහත්මිය. | රු. 1,000/- |
| ගමගේ චරිත් ප්‍රසංග - පානදුර. | ශ්‍රී පාලි විද්‍යාලය, හොරණ. | සෞම්‍යා ධර්මරත්න මහත්මිය | රු. 1,000/- |
| එච්. කවිජ කෞෂල්‍යා - දොම්පෙ. | ඉන්දොලමුල්ල කනිෂ්ඨ විද්‍යාලය, දොම්පෙ. | අජිත් ප්‍රනාන්දු මහතා. (දිලින ප්‍රනාන්දු මහත්මිය) | රු. 500/- |
| අසංක සෙනෙවිරත්න - කහටගස්දිගිලිය. | අනු/පහල කුඩාපට්ටිය මහා විද්‍යාලය. අනුරාධපුරය. | ඩී.එම්.ටී. පියුෂාන් මහතා. | රු. 1,000/- |
| චතුර මධුරංග දිසානායක - කහටගස්දිගිලිය. | අනු/පහල කුඩාපට්ටිය මහා විද්‍යාලය. අනුරාධපුරය. | ඩී.එම්.ටී. පියුෂාන් මහතා. | රු. 1,000/- |
| ටී. එම්. වරුණ රුක්ෂාන් ඒකනායක - අලුත්තරම. | බ/බතලයාය මහා විද්‍යාලය, බතලයාය. | අජිත් ප්‍රනාන්දු මහතා. (දෙනුෂි ප්‍රනාන්දු). | රු. 500/- |
| ඩබ්. අමාලි චතුරිකා විජේසූරිය - අලවතුගොඩ. | රජයේ විද්‍යා විද්‍යාලය, මාතලේ. | තරංගා වී ජයසිංහ මහතා. | රු. 1,000/- |
| ප්‍රමෝද් චතුරංග සෙන්දනායක - පෝරුවදණ්ඩ. | තක්ෂිලා මහා විද්‍යාලය, හොරණ. | ජේ. දයාවති මහත්මිය. | රු. 500/- |
| එස්. කේ. ඩී. තරිඳු සෙන්දනායක - පෝරුවදණ්ඩ. | තක්ෂිලා මහා විද්‍යාලය, හොරණ. | චම්පිකා සිරිබද්දන මහත්මිය | රු. 1,000/- |
| කල්ප සත්සරනා ජෝසප් - කොළඹ 10. | කොටහේන් ශ්‍රී කුමානන්ද විදුහල, කොටහේන. | ඉන්දික මහනාම ධර්මවර්ධන මහතා. | රු. 500/- |
| ඒ. සෝමසේනගේ පබසරා සෙව්වන්දි - වේලංවැව. | අනු/පහල කුඩාපට්ටිය මහා විද්‍යාලය. අනුරාධපුරය. | ඩී. එම්. ටී. පියුෂාන් මහතා. | රු. 1,000/- |
| දොන් ලහිරු දිල්හාර - මානෙල් මාවත. | බ/ශාන්ත ජෝන් ජාතික පාසල, පානදුර. | එස්.එම්. වික්‍රමසිංහ මහත්මිය. | රු. 1,000/- |
| කසුන් තිලකරත්න - කහටගස්දිගිලිය. | අ/නිවන්තක චේතිය මධ්‍ය මහ විද්‍යාලය, අනුරාධපුරය. | තරංගා මංචනායක මහත්මිය. | රු. 1,000/- |
| අචින්ත ප්‍රමෝද්‍ය අබේසිංහ - කහටගස්දිගිලිය. | කහටගස්දිගිලිය මධ්‍ය මහ විද්‍යාලය. | තරංගා මංචනායක මහත්මිය. | රු. 1,000/- |
| ශෂේන් අභිෂේක - කොළඹ 10. | ශාන්ත ජෝසප් විදුහල - කොළඹ 10. | පී. ඒ. නාලනී ජයලත් මහත්මිය. | රු. 1,000/- |
| බ්‍රාහ්මනගේ ගිෂාන් මධුසංක - පානදුර. | ශාස්ත ජෝසප් විදුහල - පානදුර. | සමන්තා නිලංගනී මහත්මිය. (සෙනුරි ජයවීර) | රු. 1,000/- |

සාමාජික ලිපි...





# ලුණු මදි ද?

එදිනෙදා ජීවිතයේ දී විශේෂයෙන් ආහාර සම්බන්ධ කටයුතුවල දී ලුණු භාවිතය ඉතාමත් සුලබ ව දක්නට ලැබෙන අංගයකි. මූලික වශයෙන් සෝඩියම් ක්ලෝරයිඩ්වලින් සැදුණු ලුණු ජීවිතය පවත්වා ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය ඛනිජ ලවණයකි. ඈත අතීතයේ සිට ම ආහාර රසකාරකයක් මෙන් ම ආහාර සංරක්ෂක ද්‍රව්‍යයක් වශයෙන් ද ලුණු භාවිතයට ගැනුණි. එසේ ම ලුණු, ආහාරවල ක්ෂුද්‍ර ජීවී වර්ධනය වළක්වන අතර අනෙක් රස මතු කිරීමට ද සමත් ය.

ලුණු, සිරුරේ ජලය ප්‍රමාණය සමායෝජනය කිරීමටත් (තරලවල සමතුලිතතාවය පවත්වා ගැනීම), සෝඩියම් අයන ස්නායු පද්ධතියේ ආවේග සම්ප්‍රේෂණය කිරීමේදීත් උපකාරී වෙයි. එසේ වුව ද වැඩිපුර ලුණු පරිභෝජනය විවිධ සෞඛ්‍ය ගැටළු ඇති කරයි. එනිසා සෞඛ්‍ය සංවිධාන ආහාරයට එකතු කර ගනු ලබන සෝඩියම් ප්‍රමාණයට සීමාවක් නිර්දේශ කර ඇත. ඇමෙරිකානු හෘද සංගමය (American Heart Association) දිනකට එක් අයෙකුට සෝඩියම් 1.5g ක් නිර්දේශ කර තිබේ. මෙම අගය පුද්ගලයෙකුගේ වයස අනුව, සෞඛ්‍ය තත්වය අනුව, ස්ත්‍රී, පුරුෂ භාවය අනුව සහ වෙනත් නොයෙක් සාධක අනුව වෙනස් විය හැකියි. 1.7g කට වැඩි නො වූ සෝඩියම් ප්‍රමාණයක් (එනම් ලුණු 4.2g ක ප්‍රමාණයක්) පරිභෝජනය, රුධිර පීඩනය අඩු කර ගැනීමට උපකාර වන අතර ම එම ප්‍රමාණය වෙනත් අහිතකර බලපෑම් හා සම්බන්ධතාවක් නො මැත.

## ලුණු පරිභෝජනයේ තීව්‍ර බලපෑම්

නියමිත ප්‍රමාණයට වැඩිපුර හෝ අඩුවෙන් හෝ ආහාර වේලට ලුණු එකතු කර ගැනීම නිසා මස්පිඩු පෙරළීම, කරකැවිල්ල, ස්නායු ආවේග සම්ප්‍රේෂණය පිළිබඳ ගැටළු මෙන් ම මරණය ද සිදු විය හැකි ය. ප්‍රමාණවත් ලවන ප්‍රමාණයක් පරිභෝජනයට නො ගෙන විශාල ජල ප්‍රමාණයක් පානය කිරීමෙන් මරණය පවා සිදු වන්නට පුළුවන. (Water Intoxication) එසේ ම කුඩා කාලයක දී විශාල ලවන ප්‍රමාණයක් ශරීර ගත වීමෙන් ද මරණය සිදු විය හැකි ය.

## ලුණු පරිභෝජනයේ දීර්ඝ කාලීන බලපෑම්

ලුණු පරිභෝජනයේ දීර්ඝ කාලීන ප්‍රතිඵල පිළිබඳ විද්වතුන් නොයෙකුත් මතවාද දරයි. විවිධ පර්යේෂණ මගින් පහත සඳහන් රෝග සහ ලුණු පරිභෝජනය අතර සම්බන්ධතාවයන් පවතින බව සනාථ කර ඇත.

1. **ආඝාතය (Stroke) සහ හෘදවාහිනී සම්බන්ධ රෝග (Cardiovascular Disease)**
2. **අධි රුධිර පීඩනය**
3. **හෘද විවර්ධනය (Cardiac Enlargement)**
4. **වකුගඩු ආශ්‍රිත රෝග**
5. **තරල එක් රැස් වීම**
6. **උදරය ආශ්‍රිත පිළිකා**

ලුණු, රුධිර පීඩනය පාලනය කිරීම සඳහා ඉතා වැදගත් සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. හෘදයාබාධ, ආඝාතය, වකුගඩු රෝග යනා දී බොහෝ රෝග සඳහා අධිරුධිර පීඩනය හේතු සාධකයකි. දිනකට 3 කට ලුණු පරිභෝජනය අඩු කිරීමෙන් අධිරුධිර පීඩනය සහිත රෝගීන්ගේ රුධිර පීඩනය 3.6 - 5.6 / 1.9 - 3.2 mmH ට ප්‍රමාණයකින් අඩු වන බව සොයා ගෙන ඇති අතර එමගින් ආඝාතය 13% කින් ද හෘදයාබාධ 10% කින් ද අඩු කර ගත හැකි බවට අනුමාන කර ඇත.

එසේ ම වැඩිපුර ලුණු පරිභෝජනය ඔස්ටියෝපොරෝසිස් වැනි අස්ථි ආශ්‍රිත රෝග හට ගන්නට බලපෑ හැකි අතර ම මුත්‍රාශයේ ගල් හට ගැනීමේ අවදානම ද වැඩි කරයි. එමෙන් ම සිරෝසිස් වැනි රෝගවලින් පෙළෙන රෝගීන්ට සම්පූර්ණයෙන් ම ලුණු පරිභෝජනයෙන් වළකින්නට හෝ සීමා කරන්නට වෛද්‍ය උපදෙස් ලැබේ.

සකසන ලද ආහාරවලට ආහාර නිෂ්පාදකයන් ලුණු එකතු කිරීම සිදු කරන අතර පුද්ගලයකුගේ ලුණු පරිභෝජනයෙන් 76% ක් අයත් වන්නේ මෙම ආහාර භාවිතයෙන් එකතුවන කොටසට ය. 5% ක් ස්වභාවික ව ආහාරවල අඩංගු වේ. 19% ක් ආහාර පිසින විට හෝ අනුභවයේ දී එකතු කරන ලුණු නිසා සැපයේ. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් පවත්වා ගැනීම සඳහා ලුණු පරිභෝජනය අඩු කර ගැනීමට භාවිත කළ හැකි ප්‍රායෝගික ක්‍රම කිහිපයකි. එනම්, වෙළඳපොළේ ඇති අධික ලුණු සහිත සකසන ලද ආහාර පරිභෝජනය සීමා කර නිවසේ පිසින ලද ආහාර වැඩිපුර පරිභෝජනයට ගැනීම, ආහාර සඳහා ලුණු එක් කිරීම වෙනුවට ගම්මිරිස්, විනාකිරි, දෙහි වැනි වෙනත් රසකාරක භාවිත කිරීම, ආහාර පිසීමේ දී ලුණු වෙනුවට ආදේශක භාවිත කිරීම (මෙහි දී වකුගඩු ආබාධ, හෘදයාබාධ හෝ දියවැඩියාව සහිත පුද්ගලයන් වෛද්‍ය උපදෙස් අනුව ආදේශක භාවිත කළ යුතු ය.), සෝඩියම් වෙනත් ආකාරවලින් ද ආහාරයට එක් කර තිබිය හැකි බැවින් (මොනොසෝඩියම් ග්ලූටමේට්, සෝඩියම් බයිකාබනේට්, බේකින් පව්ඩර්, ඩයිසෝඩියම් ෆොස්ෆේට් වැනි) සකසන ලද ආහාරවල ලේබල් පිළිබඳ ව සැලකිලිමත් වීම සහ ඒ අනුව සුදුසු ආහාර පරිභෝජනයට ගැනීම යනාදී උපක්‍රම භාවිත කළ හැකි ය.

අහිතකර ආහාර පුරුදු නිසා අලුතින් රෝගාබාධ හට ගන්නට හෝ හට ගත් රෝගාබාධ උත්සන්න වන්නට අවදානම් ඇති මුත් බොහෝ පිරිස් එය අමතක කර දමා සුපුරුදු පරිදි තමන්ගේ දිව පිනවන්නට පසුබට නො වෙති. කෙනෙකුට දිවෙන් රසය දැන ඒ රසයට නො ඇලෙන්නට නො ගැටෙන්නට හැකි නම් කෙතරම් ලාභයක් ද? දිවෙන් රස දැන එයට නො ඇලුණු, නො ගැටුණු අසහාය මුණිවරු වැඩ සිටි සම්බුදු සසුන කෙතරම් අසිරිමත් ද?

සාදු ! සාදු !! සාදු !!!

තථාගත අරහත් සම්බුදු සමිඳාණන් මහා කරුණාවෙන් පෙන්වා වදාළ ඒ සොඳුරු අරි අටමගෙහි වැඩ සදා සුවපත් වූ උතුම් සඟ රුවනට නමස්කාර වේවා !

- සටහන -

කැනඩාවෙහි වෙසෙන මෙත් සවිය සාමාජිකා
චන්ද්‍රලතා මහත්මිය විසින් සපයා ඇත.

# නිවේදන සහ නොමිළයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිළයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දිම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න.** (**011-2505088, 0714-014467**). එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවිය වන www.methsaviya.org** මගින්ද තොරතුරු ලබා ගත හැකිය.
මීට අමතරව සම ලේකම් වන අජිත් නිශාන්ත මහතාගේ පුද්ගලික දුරකතන අංකය (0714 46 72 72) අමතා ද හදිසි තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මගින් **දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## තිස් දෙවන භාවනා වැඩසටහන

2015 ජුලි මස 12 වන දින සිට ඇරඹීමට නියමිත තිස් දෙවන භාවනා වැඩසටහන සඳහා 2015-06- 21 දිනට පෙර සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/ නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.

## අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා 28 වන වැඩමුළුව

ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥාව පිළිබඳව දැණුවත් කිරීමේ 28 වන වැඩමුළුව 2015-04-26 දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 28 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2015-04-19 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.

### දෙමළ භාෂාව

අධ්‍යාපන අමාත්‍යාංශයේ සිටි මෙත්සවිය සාමාජිකාවක් විසින් 6, 7, 8. ශ්‍රේණි සඳහා දෙමළ භාෂාව නිවසට පැමිණ හෝ පංති වශයෙන් උගන්වනු ලැබේ.

කොළඹ/ මහරගම අවට විශේෂයි.

**දුරකථන : 071- 8498324**

### ඇඳුම් මැසීම

සාරි හැට්ට, කාන්තා අඳුම් සහ ළමා ඇඳුම් මැසීම භාරගනු ලැබේ.

**සාරි හැට්ට පැය 24 ක් තුල දී මසා දිය හැක.**

විමසීම් : මෙත්සවිය සාමාජික

**දුරකථන : 075 5947947**

### ඇඳුම්

මෙත් සවිය සාමාජිකාවක් විසින් මසා නිම කරන ලද කාන්තා රාත්‍රී ඇඳුම් (නයිටි) ඉතාමත් සාධාරන මිලකට

මෙත්සවිය පොත් අලෙවි සැලෙන් ලබාගත හැක

**සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්** **SIGHT 'N' STYLE OPTOMETRISTS**

නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ. (අනුලා විදුහල ඉදිරිපිට) දුරකථන : 2854758

**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න.)**

## මෙත් සවිය මනස අධ්‍යාපන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)

01. සම්පූර්ණ නම ....................

02. ස්ත්‍රී / පුරුෂ භාවය .................... 3. ජාතික හැඳුනුම්පත් අංකය ....................
(ඡායා පිටපතක් අමුණන්න)

04. උපන් දිනය .................... 5. වයස .................... 6. ආගම ....................

07. ස්ථිර ලිපිනය ....................
විද්‍යුත් තැපෑල (e-mail) .................... දු:කථ: නිවස .................... ජංගම ....................

08. දිස්ත්‍රික්කය .................... 9. විවාහක / අවිවාහක බව ....................

10. රැකියා කරන්නේ නම්, ආයතනයේ නම ....................
(ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ....................

11. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ....................

12. ලිපි එවිය යුතු ලිපිනය ....................

13. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්
1. ....................
2. ....................

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර
1. ....................
2. ....................
3. ....................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ....................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

17. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.
....................

18. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ....................
....................

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .................... අයදුම්කරුගේ අත්සන ....................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ....................

.................... ....................
තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ....................

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරි මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 2,500 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 1,500 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරිතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය සඳුදා, අඟහරුවාදා, හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

ලිපිනය :- ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 06, දුරකථන : 0112 505088, 0714 014467, www.methsaviya.org / www.methsaviya.lk

# සඳහම් චාරිකාවෙහි තතු ...

2015 ජනවාරි මස 31 වන දිනට යෙදුන දාන - සීල - භාවනා සඳහම් චාරිකාවේ දී මහියංගනය බුදුපිළිමය නෙළීම අධීක්ෂණය, පිළිමය ඉහළට නැංවීම ආරම්භය සහ දඹාන ආදී වාසින් වෙත ආධාර ලබා දීමේ වැඩසටහන් පෙළ සාර්ථකව නිමා කරන ලදී.




මහියංගන චෛත්‍යරාජයානන් වහන්සේ අසල සිට අෂ්ඨාංග උපෝසත සීලය සමාදන් වීම සහ උපාසක උපාසිකාවන් සඳහා උදෑසන කැඳ දානය...











කාන්තා කමිටුවේ මූලිකත්වයෙන් සඳුන් දර යොදා උඩුවියන් බැඳ පිරිත් කියමින් කිරි ආහාර පූජාව තැනීම සහ කප්රුක් පූජාව පැවැත්වීම.




මහියංගන රාජ මහා විහාර භූමියේ මෙත්සවිය මගින් ඉදිකරනු ලබන

# 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ

ඉහළට නැංවීමේ වැඩ බිම මහත් උත්කර්ෂවත් අන්දමින් ඇරඹීම.














මරණයට කැප වූ තාරාවන් සහ පාත්තයින් විල්ලුව වැවට නිදහස් කොට

## අභය දානය ලබා දීම









## දහවල් දානය දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ දී...










අභිනවයෙන් තනනු ලබන දඹාන ආදිවාසී
ජනඋරුම විහාරස්ථානයේ

භාවනා කුටි ඉදිකිරීමේ මූලික මුදල ලෙස
**රුපියල් 100,000.00 ක මුදලක්**

මාවරගල ආරණ්‍ය සේනාසනයේ
නායක ස්වාමින්වහන්සේ වෙත
මෙත්සවිය සාමාජිකයින්ගේ
ධන පරිත්‍යාගයෙන් රැස් කර පූජා කිරීම.









## ලක්දිව අවසන් මහරහතන් වහන්සේ වන මලියදේව මහරහතන් වහන්සේ දම් දෙසූ මාවරගල ආරණ්‍යයේ ගල්තලාව මත සිට ධර්මශ්‍රවණය කිරීම.

# දඹාන ආදිවාසී වැදි ගම්මානයේ පිංබර මතක සටහන්...



දඹාන ආදිවාසීන්ට සවියක් වෙමින් මෙත් සවිය සාමාජිකයින් විසින්
නව ආදිවාසී ජනඋරුම විහාරස්ථානයේ තනනු ලබන ජය ශ්‍රී මහා බෝධි ශාඛාවේ,
කණු 60 කින් යුක්ත වන රන්වැටෙ හි රන් කණු 40 ක් සඳහා අවැසි
රුපියල් 157,000.00 ක මුදලක් වන්නිලඇත්තන් වෙත පරිත්‍යාග කිරීමේ අවස්ථාව.



ඉර අවරට යාමට පෙර ... දඹාන ආදිවාසීන් සමඟ මොහොතක්



ආදිවාසී සම්ප්‍රදායට අනුව කිරි කොරහ නටා මෙත් සවිය සාමාජිකයින්ගේ වස් දොස් යැවීමේ ප්‍රයත්නය

## 2015 ජනවාරි මස පළමු දින වසරේ ප්‍රථම හීල් දානමය පුණ්‍යකර්මය හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ දී, මෙත්සවිය සාමාජිකයින් විසින් සිදු කරන අවස්ථාව...













2015 ජනවාරි මස පළමු දින ජයන්ති ළමා නිවාසයට දහවල් දානය හා උපකරණ පරිත්‍යාග කිරීම පිළිබඳ ඡායාරූප මෙවර සඟරාවේ ඉඩකඩ මදි බැවින් ඉදිරි කළාපයක දී පළකරනු ලැබේ.











බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදු වී වසර 2603 ක් සපිරෙන
2015 ජනවාරි මස 03 වන දුරුතු පොහෝ දින
මෙත් සවිය බුදුපිළිම ක්‍රියාකාරී කමිටුවේ 21 දෙනෙකු ඇතුළු පිරිසක්
බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූ මහියංගනය රාජ මහා විහාරස්ථානයෙහි
මෙත් සවිය මගින් තැනෙන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ
ඉහළට නැංවීම සඳහා වන වැඩබිම සැකසීම සහ සැදැහැවතුන්ගෙන්
මුදල් ආධාර එකතු කිරීම පිණිස සිදුකළ චාරිකාවේ අවස්ථා කිහිපයක් ...

ඩිනාර් ප්‍රින්ටර්ස් 2/99, නාවල පාර, නුගේගොඩ - 011 2827044 / 0712 285 680